# මඩුවන්වෙල වලව්වේ ගෘහ නිර්මාණ ශිල්පය


*එච්. ඩබ්ලිව්. සුභද්‍රා ජීවනී* [1]

*එච්.එච්.එන්.එස්. හේවාවසම්* [2]



Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka



සංක්ෂේපය

කොළොන්න කෝරළයේ ඉතිහාසය පිළිබඳ සොයා බලමින් මඩුවන්වෙල වලව්වේ ඇති වැදගත්කම සොයා යාම අරමුණු කර ගත් මාගේ පර්යේෂණය තුළ ඉදිරිපත් කරනු ලබන්නේ මඩුවන්වෙල වලව්වේ ගෘහ නිර්මාණ ශිල්පය පිළිබඳවයි. මඩුවන්වෙල වලව්ව පිළිබඳ ලියැවුණු කෘති  ඇතත් ඒවා පර්යේෂණාත්මක මට්ටමින් සිදු නොවීම නිසා මෙම පර්යේෂණය කෙරෙහි අවධානය යොමු කරන ලදී. කොළොන්න කෝරළයේ ඉතිහාසය හදාරන විට මඩුවන්වෙල වලව්ව වැදගත් වන බවට පූර්ව නිගමනයකින් මෙම පර්යේෂණය සිදු කළ අතර ඒ පිළිබඳව අධ්‍යයනය කිරීමට යොදා ගත් ප්‍රධාන ම ක්‍රමවේදය ක්ෂේත්‍ර අධ්‍යයනයයි. එහිදි වලව්වෙහි පුරාවිද්‍යාත්මක නටබුන් කෙරෙහි  මූලික අවධානය යොමු කරන ලදී. පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයට අමතරව සාහිත්‍ය මූලාශ්‍රය කෙරෙහි ද අවධානය යොමු කරන ලදී.  ලන්දේසි යුගයේ සිට බ්‍රිතාන්‍ය යුගයේ අවසානය දක්වා කොළොන්න කෝරළයේ ප්‍රසිද්ධියට පත් මඩුවන්වෙල වලව්වේ ගෘහ නිර්මාණ ශිල්පය කෙරෙහි අවධානය යොමු කරනවිට පෙනීයන්නේ සමස්ත වලව් භූමියෙහි පිහිටීම ප්‍රධාන කොටස් හතරක් ඔස්සේ සාකච්ඡා කළ හැකි බවයි. එනම්, මහ බංගලාව සම්බන්ධ පවුලේ කටයුතු සිදු කළ ගොඩනැගිලි, රැස්වීම් ශාලාව හෙවත් බුරුත මාලිගය, අධිකරණ ශාලාව හා ඒ හා සම්බන්ධ කොරිඩෝව, සහ පිවිසුම් දොරටු හා ප්‍රාකාර බැම්ය. මඩුවන්වෙල වලව් ගොඩනැගිල්ල වර්තමාන වපසරිය ප්‍රමාණයෙන් වර්ග අඩි 17143 කි. වලව්වේ ගෘහ නිර්මාණ ශිල්පය දෙස බලනවිට පෙනී යන කරුණක් වන්නේ මෙම ගොඩනැගිලි  වරින් වර වරිච්චි බිත්තියෙන් ගොඩ නගා එයට කොටස් එකතු කර ඉදිකරන ලද ගොඩනැගිල්ලක් බවයි. වහලය සඳහා සිංහල උළු මෙන් ම පෙති උළු ද යොදා ගෙන ඇත. එසේම එක් දොරටුවකින් ඇතුළු වූ පසු ගොඩනැගිල්ල පුරා ම ඇවිදගෙන යා හැකි පරිදි එකිනෙකට සම්බන්ධ වන ලෙස දොරවල් යොදා තිබීම ද විශේෂත්වයකි. එය එකල වාස්තු විද්‍යාවේ අංගයක් වන්නට ඇත. ශක්තිමත් පාදම, ඝනකම් වරිච්චි බිත්ති හා වහලයේ බර සම්පූර්ණයෙන් බිත්තිවලට නොවැටෙන ලෙස ගොඩනැගිල්ල වටා ශක්තිමත් දැව කඳන් රාමු ද වලව්වේ කල්පැවැත්මට හේතු වී ඇති බව දක්නට ලැබේ. පිහිටි පොළොවේ සිට අඩි 3 1/2 උසට වේදිකාවක් සේ පුරවා සකස් කර ගත් පාදමක් මත මහනුවර සම්ප්‍රදායට අනුව ගොඩනැගුණු වලව්ව තුළ විවිධ කාර්යයන් සඳහා විවිධ කාමර වෙන් කර තිබූ බව පෙනේ. මොසැයික් කලාව ප්‍රමුඛ කර ගත් පිඟන් කටු මෝස්තර යටතේ අලංකාර වූ වලව් ගොඩනැගිල්ල වාස්තු විද්‍යත්මක හා ගෘහ නිර්මාණ ශිල්පය අතින් ඉතා විශිෂ්ට වලව් ගොඩනැගිල්ලක් බවට පත්ව තිබෙන බව දක්නට ලැබේ.



ප්‍රමුඛ පද :- මඩුවන්වෙල වලව්ව ,  ගෘහ නිර්මාණ ශිල්පය



*1. ඉතිහාසහය, ඉතිහාස අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*
subadrajeewani2@gmail.com

*2. ඉතිහාස අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*